# 9 ශ්‍රී ලංකාව හා බටහිර ජාතීන්


**මෙම ඒකකය මගින් ඔබට දහසය වන සියවසේ සිට ශ්‍රී ලංකාවට පැමිණි බටහිර ජාතීන් එනම්, පෘතුගීසීන් ලන්දේසීන් හා ඉංග්‍රීසීන් එවකට ලංකාවේ පැවති රාජ්‍යයන් සමග පැවැත්වූ සබඳතා පිළිබඳ අධ්‍යයනයට ඉඩ සලසා ඇත. මෙම සබඳතා සුහද හා සතුරු ලෙස ගොඩනැගී ඇති ආකාරය ඔබේ අවධානයට යොමු කර ඇත.**

ක්‍රි.ව. 1453 දී කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ඔටෝමන්වරුන් සතුවීම නිසා යුරෝපීයයන් එතෙක් ගනුදෙනු කළ පෙර අපර දෙදිග මුහුදු හා ගොඩබිම් වෙළෙඳ මාර්ග සියල්ල ම පාහේ අවහිර විය. මේ නිසා යුරෝපීයයන්ට පෙරදිගට පැමිණීම සඳහා නව මාර්ග සොයා ගැනීමට සිදුවිය. ඒ අනුව පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන යුරෝපීය ජාතිකයෝ ඔවුන් සොයාගත් නව වෙළෙඳ මාර්ග ඔස්සේ ලංකාවට පැමිණිය හ. ඔවුන් පෙරදිගට පැමිණියේ කුළුබඩු සොයා ගැනීම, වෙළඳාම හා ධර්මය ප්‍රචාරය කිරීමේ අරමුණ ඇතිවයි. මෙම ජාතීහු තම අරමුණ ඉටු කර ගැනීම සඳහා පෙරදිග රාජ්‍ය සමග සුහද හා ඇතැම් විට ආක්‍රමණශීලි ප්‍රතිපත්ති ද අනුගමනය කළහ.

ලංකාවට එසේ පැමිණි පළමු බටහිර ජාතිය වූයේ පෘතුගීසීන් ය.

ක්‍රි.ව. 1505 දී ලොරෙන්සෝ ද අල්මේද ඇතුළු පිරිසක් ශ්‍රී ලංකාවේ ගාලු වරායට සේන්දු විය. ඔවුන්ගේ පැමිණීම අහම්බෙන් සිදු වුවත් පෘතුගාල රජු ලංකාවේ සාරවත් කුරුඳු බිම් පිළිබඳ ව අසා තිබිණි. ඒ නිසා පෘතුගීසිහු පෙරදිගට පැමිණීමේ දී ලංකාව පිළිබඳ තොරතුරු දැනගෙන සිටියහ. ඔවුහු ගාලු වරායට ගොඩ බසින විට මේ ලංකාව යැයි නොදැන සිටියහ. ගාලු වරායෙන් කොළඹ වරායට යාත්‍රා කළ ඔවුනට මුස්ලිම්වරුන් එම වරාය මධ්‍යස්ථානය කර ගනිමින් වෙළෙඳාමේ යෙදෙන ආකාරය දැකගත හැකි විය.

මෙම හම සුදු අමුතු ඇඳුම් ඇඳගත් පිරිසකගේ පැමිණීම පිළිබඳ ව බිය වූ ජනතාව කොළඹ වරායේ සිට රජ මාලිගාව වෙත ඔවුන් කැඳවාගෙන එන ලද්දේ ඉතාම දීර්ඝ මාර්ගයකිනි. එය රජු ආරක්ෂාව සඳහා යොදගත් උපාය මාර්ගයකි. මේ නිසා "පරංගියා කෝට්ටේ ගියා වගේ" යන ප්‍රස්තාව පිරුළ සෑදුනි.



**සිතියම 9.1**
**පෘතුගීසීන් ලංකාවට පැමිණෙන අවධියේ ලංකාව**

## පෘතුගීසින්ගේ පැමිණීම.


ලංකාවේ වෙළෙඳ කටයුතුවල යෙදුන මුස්ලිම්වරුන්ට පෘතුගීසින් තර්ජනයක් විය. මුස්ලිම්වරුන් සිංහල ජනතාවගේ ද ආධාර ගෙන පෘතුගීසීන් පලවා හැරීමට කටයුතු කළත් එය අසාර්ථක වී ඇත.

බොම්බායට දකුණින් පිහිටි ගෝව තම පෙරදිග මධ්‍යස්ථානය කර ගත් පෘතුගීසීහු ඉන්දියන් සාගරයට පිවිසෙන දෙරටු සේ සැලකෙන පර්සියන් බොක්ක ආශ්‍රිත ඕමස්හි ද මලය අර්ධද්වීපයේ මලක්කාව යන ස්ථානවලත් බලකොටු ගොඩනැගුහ. ලංකාව කෙරෙහි ද අවධානය යොමු කරමින් කොළඹ වරායේ තම බලය තහවුරු කර ගැනීම සඳහා කොළඹ බල කොටුවක් ඉදිකිරීමට ක්‍රි.පූ. 1518 දී උත්සාහ කළත් මුස්ලිම්වරුන් සිංහලයන් ද සහාය කරගනිමින් එය ව්‍යවර්ථ කර ඇත. කෙසේ වුව ද ආයුධ සන්නද්ධ නොකළ වෙළෙඳ ගබඩාවක් එහි ගොඩනැගීමට පාතුගීසීහු සමත් වූහ.

# කෝට්ටේ සමග සම්බන්ධතා

"විජයබා කොල්ලය" නම් වූ ක්‍රි.ව. 1521 දී කෝට්ටේ රාජ්‍ය සඳහා ඇති වූ අභ්‍යන්තර අර්බුදය පෘතුගීසීන්ට කෝට්ටේ කටයුතුවලට සම්බන්ධ වීමට ලැබූ කදිම අවස්ථාවක් විය. "විජයබා කොල්ලයෙන්" පසු ව කෝට්ටේ රාජ්‍යය කොටස් 3කට බෙදිණ.

එනම් කෝට්ටේ, සීතාවක හා රයිගම වශයෙනි. කෝට්ටේ නගරය මූලික කරගත් ප්‍රධාන කොටස හිමි වූ බුවනෙකබාහු හත්වැනි බුවනෙකබාහු නමින් අභිෂේක ලැබී ය. රයිගම අගනුවර කරගනිමින් මද්දුම බණ්ඩාර රයිගම් බණ්ඩාර නමින් අභිෂේක ලැබී ය. කාර්යශූර පුද්ගලයෙකු වූ මායාදුන්නේට සීතාවක හිමි විය. විජයබා කොල්ලය මෙහෙය වූ පුද්ගලයා වූයේ මායාදුන්නේ ය. මේ නිසා තම සොයුරා ගැන බුවනෙකබාහු රජු බියෙන් පසු විය. එනිසා, ඔහු මුල සිට ම පෘතුගීසීන්ගේ සහාය පැතී ය. පෘතුගීසීන් ද අවස්ථාවෙන් ප්‍රයෝජන ලබා කෝට්ටේ රාජ්‍යයෙන් මුස්ලිම්වරුන් පලවා හරින ලෙස රජු පෙළඹ වී ය. මායාදුන්නේ රජු මීට තදින් විරුද්ධ වීම නිසා දෙසොහොයුරන් අතර ඇති වූ අර්බුදයේ දී බුවනෙකබාහු රජු පෘතුගීසීන්ගේ උදව් ලබාගත් අතර මායාදුන්නේ රජු ඉන්දියාවේ පෘතුගීසී විරෝධී කැලිකට්හි පාලක සැමොරින්ගේ උදව් ලබා ගත්තේ ය.




**සිතියම 9.2 කෝට්ටේ බෙදීම**

පෘතුගීසීන් සටන්වල දී කළ ආධාර සඳහා යුද්ධ වියදම් ලෙස කෝට්ටේ රජුගෙන් කුරුඳු ඇතුළු වෙළෙඳ ද්‍රව්‍ය විශාල වශයෙන් ලබාගන්නා ලදී.

බුවනෙකබාහු රජුට තමා ඇවෑමෙන් රජ කිරීමට පුතෙක් නොසිටි බැවින් තම දියණිය වූ සමුද්‍රදේවියගේ පුත් ධර්මපාල කුමරු රජකම සඳහා නම් කළ අතර ඔහුට අධ්‍යාපනය ලබා දීම පෘතුගීසි පූජකයන්ට පවරන ලදී. බුවනෙකබාහු රජු විසින් ධර්මපාල කුමරුගේ පිළිරුවක් තනවා එයට ලිස්බනයේ දී පෘතුගාල රජු විසින් ඔටුනු පලඳවා ඇත. එසේ කිරීමෙන් බලාපොරොත්තු වූයේ ධර්මපාල කුමරු රජ වුවාට පසු ව ඔහුගේ රජයට පෘතුගාල රජුගේ ආරක්ෂාව ලැබෙන බව සංකේතවත් කිරීම යි. මෙසේ පෘතුගීසින් හා බුවනෙකබාහු රජු අතර වැඩුණු සම්බන්ධතාව කෝට්ටේ සහ සීතාවක රාජ්‍ය අතර පැවැති විරුද්ධත්වය වැඩි දියුණු කිරීමට හේතු විය. ඉහත කී දූත පිරිස පෙරළා පැමිණෙන විට ඔවුන් සමග රජතුමාගේ ආරාධනය පරිදි ෆ්‍රැන්සිස්කන් නිකායට අයත් කතෝලික පියවරු හතරදෙනෙක් ද ලංකාවට පැමිණියහ. කෝට්ටේ රාජ්‍යයේ කතෝලික ආගමික කටයුතු මේ පූජකවරුන් විසින් ආරම්භ කරන ලදී. ඒ අනුව බලන විට ලංකාවේ තිබූ දේශපාලනමය අර්බුදවලින් උපරිම ප්‍රයෝජන ගනිමින් පෘතුගීසීහු පෙරදිගට පැමිණීමේ අරමුණු වූ වෙළඳාම, කුළුබඩු හා ආගම් ප්‍රචාරය උපරිම අයුරින් ඉටු කර ගත්හ.

තම අරමුණු තව දුරටත් ඉටුකර ගැනීම සඳහා මායාදුන්නේ රජු මැරීමට පෘතුගීසීන් දුන් උපදෙස් බුවනෙකබාහු රජු ප්‍රතික්ෂේප කිරීම නිසා රජු හා පෘතුගීසි යන දෙපක්ෂය අතර මතභේද ඇති විය. ඒ වගේ ම රජු කතෝලික ආගම වැළඳ නොගැනීම ද මෙම විරසකයට තවත් හේතුවක් විය. මේ අතර බුවනෙකබාහු රජු උඩු මහලේ සක්මන් කරමින් සිටින විට පෘතුගීසී සොල්දාදුවෙකුගේ වෙඩි පහරින් මියයාම පෘතුගීසි අධිකාරියේ අනුදැනුම අනුව සිදු වූ බවට විශ්වාස කෙරේ. ඉන්පසු ළාබාල ධර්මපාල කුමරු රජ කමට පත්වීමෙන් පෘතුගීසීන්ට කෙළින් ම කෝට්ටේ පාලනය මෙහෙයවීමට අවස්ථා උදාවිය. මෙය කතෝලික ආගම් ප්‍රචාරයට ද හොඳ අවස්ථාවක් විය.

මේ තත්ත්වයට විරුද්ධ වූ ධර්මපාල කුමරාගේ පියා වූ වීදිය බණ්ඩාර කුමරු පෘතුගීසීන්ට විරුද්ධ ව ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. මුහුදුබඩ ඉදිකරවා තිබූ කුඩා දේවස්ථාන විනාශ කළ ඔහු පෘතුගීසීන්ට විරුද්ධ ව කැරලි සංවිධානය කළත් ඒවා අසාර්ථක විය. තව දුරටත් ධර්මපාල රජුගේ ආරක්ෂකයා වශයෙන් පෘතුගීසීන් තවත් බලවත් වූ අතර ධර්මපාල රජු කතෝලිකයෙකු වශයෙන් බෞතීස්ම ලැබීම ඔවුන්ගේ විශාල ජයග්‍රහණයක් විය.

ධර්මපාල රජු කතෝලික වීම නිසා එතෙක් ලංකාවේ පැවති රාජ්‍ය උරුමය හා රාජ්‍ය සම්ප්‍රදාය බිඳ වැටීමක් සිදුවිය. මේ නිසා බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය උඩරට හා සීතාවක රාජධානි වෙත ලැබුණි. රාජ්‍ය උරුමයේ සංකේතය වූ දළදා වහන්සේ සීතාවක රාජධානියේ තැන්පත් කිරීමෙන් රටවැසියන්ගේ පක්ෂපාතිත්වය සීතාවක මායාදුන්නේ රජුට ලැබුණි. ධර්මපාල රජු පෘතුගීසීන්ගේ රූකඩයක් විය. එය කෝට්ටේ රාජධානියේ පරිහානියට ද හේතු විය.

රයිගම ප්‍රදේශය ද සීතාවකට ලබා ගනිමින් ක්‍රමයෙන් නැගී එමින් තිබූ සීතාවක රාජ්‍යයට පෘතුගීසීන් පලවා හැරීමේ වගකීම පැවරුණි. රණ ශූරයකු වූ මයාදුන්නේ රජුගේ පුත් ටිකිරි බණ්ඩාර කුමරු ක්‍රි.ව. 1562 දී මුල්ලේරියා සටනින් පෘතුගීසීන්ට ඔවුන් පෙරදිග දී ලැබූ දරුණුතම පරාජය හිමිකර දුනි.

## මුල්ලේරියා සටන

ධර්මපාල රජු පොළඹවාගෙන සීතාවක රාජ්‍යය ආක්‍රමණය කිරීමට පෘතුගීසීන්ට අවශ්‍ය විය. එබැවින් අපෝන්සු, පෙරෙයිරා ද ලසර්ද නම් පෘතුග්‍රීසි සෙනෙවියා යටතේ විශාල හමුදාවක් සීතාවක ආක්‍රමණය සඳහා පිටත්ව ගියේ ය. මායාදුන්නේ රජුගේ පුත් ටිකිරි බණ්ඩාර කුමරුගේ නායකත්වය යටතේ පෘතුගීසින් හා මුහුණට මුහුණලා කෙරුණ මහා සංග්‍රාමය මුල්ලේරියාවේ දී සිදු විය. මේ සටනේ දි පෘතුගීසි නායකයා ඇතුළු පිරිස අන්ත පරාජයට පත් විය. පාතුගීසීන් පෙරදිග ජාතියක් අතින් එතෙක් ලැබූ දරුණු ම පරාජය මෙය වශයෙන් වාර්තාගත වේ.

ඉන්පසු ව ද පෘතුගීසි විරෝධතා සීතාවක රාජ්‍යය තුළින් මතුවීමෙන් කෝට්ටේ රාජ්‍ය ආරක්ෂා කර ගැනීමට නොහැකි ව පෘතුගීසීහු ධර්මපාල රජ ද සමගින් කොළඹ කොටුව වෙත පලා ගියෝ ය.

මායාදුන්නේ රජුගේ මරණින් පසු සීතාවක ටිකිරි කුමරු පළමුවැනි රාජසිංහ නමින් අභිෂේක ලැබී ය. එතුමා විසින් දිගින් දිගට ම ගෙන ගිය පෘතුගීසි විරෝධතා නිසා පෘතුගීසී බලය කොළඹ කොටුවට පමණක් සීමා කිරීමට හැකි විය.

ගෝවෙන් ලද ආධාර වැළැක්වීමට රාජසිංහ රජුට නාවික බලයක් නොතිබීමත් නිසා පෘතුගීසීන් මෙරටින් පන්නා දැමීමට නොහැකි විය.

ධර්මපාල රජු තමාගෙන් පසු රජකම සඳහා පුතෙකු නොවූ බැවින් පෘතුගීසීන්ගේ බලපෑම මත ක්‍රි.ව. 1580 දී තෑගි ඔප්පුවක් මගින් පෘතුගීසීන්ට කෝට්ටේ රාජ්‍ය පවරන ලදි. ක්‍රි.ව. 1597 දී රජු මියයාමෙන් පසු එම තෑගි ඔප්පුව සිංහල ප්‍රධානීන්ට පෙන්වා ඒ අනුව පෘතුගාලයේ රජු මෙතැන් සිට ලංකාවේ රජු බවට ප්‍රකාශයට පත්කරන ලදී. එමෙන් ම මෙරට පැවති සම්ප්‍රදාය අනුව පාලනය ගෙන යාමට පොරොන්දු වීම නිසා සිංහල ප්‍රධානීහු ද පෘතුගාල රජුට පක්ෂපාතීත්වය දැක්වීමට ප්‍රතිඥා දුන්හ. මල්වානේ පිහිටි අසවේදූගේ නිල නිවසේ දී මෙය සිදුවීම නිසා මෙම ගිවිසුම "මල්වානේ ගිවිසුම" නමින් හැඳින්විය. එම ගිවිසුම අනුව චිරාගත නීතිරීති අනුව පාලනය වීමට සිංහලයන් කැමැත්ත දැක්වීමත් පෘතුගීසීන් එපරිද්දෙන් කටයුතු කිරීමට ප්‍රතිඥා දිමක් සිදු විය. ඒ අනුව පෘතුගාල මහ රජුගේ නියෝජිතයා ලෙස කෝට්ටේ පාලන කටයුතු කපිතාන් ජෙනරාල් විසින් සිදුකරන ලදී.

පෘතුගීසින් ලංකාවට පැමිණෙන විට යාපනයේ පාලකයා වූයේ ආර්ය චක්‍රවර්තී පරපුරෙන් පැවත එන පරරාජසේකරම් නම් රජු ය. ක්‍රි.ව. 1519 දී සංකිලි නම් කුමාරයෙක් පරරාජසේකරම් රජු මරවා රජ බවට පත් විය. මේ අතර පරරාජසේකරම් රජුගේ පුත්‍රයෙක් පෘතුගීසීන් වෙත ගොස් රාජ්‍ය බලය අල්ලා ගැනීමට ඔවුන්ගේ ආධාර ඉල්ලී ය. යාපනය රාජ්‍ය තුළ කතෝලික ආගම පැතිරවීමටත් කප්පම් ලබාගැනීමට පොරොන්දුව ඇති ව ක්‍රි.ව. 1543 දී පෘතුගීසින් යාපනයට පැමිණි නමුත් සංකිලි රජු ද එම ඉල්ලීම ලබාදෙන බවට ප්‍රකාශ කර සිටි හෙයින් පෘතුගීසීහු පරරාජසේකරම් රජුගේ පුත්‍රයාගේ ඉල්ලීම අමතක කර දැමූ හ.

සංකිලි රජු සමග ගිවිසුමක් ඇති කර ගැනීමෙන් පසු පෘතුගීසීහු යාපනය ප්‍රදේශයේ කතෝලික ආගම ප්‍රචාරය කිරීම ආරම්භ කළ හ. මෙය හින්දු පූජකවරුන්ගේ නොසතුටට හේතුවීම නිසා සංකිලි රජුට කතෝලික විරෝධි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සිදු විය. එබැවින් පෘතුගීසීහු රජුට විරුද්ධ ව හමුදවක් එවූහ. සංකිලි රජු පලාගිය නිසා යාපනය හා නල්ලූරු ප්‍රදේශ පෘතුගීසීහු කොල්ලකෑහ. නමුත් පෘතුගීසීන් සමග සුහද ව සිටීම වැදගත් බව අවබෝධ කරගත් සංකිලි රජු නැවත ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පොරොන්දු විය. ඒ අනුව පෘතුගීසීහු මන්නාරමේ බලකොටුවක් ඉදි කළහ. මෙම රජුගේ ක්‍රියාකලාපය කෙරෙහි අසතුටට පත් වැසියෝ රජු නෙරපා හැර ඔහුගේ පුත් පුවිරාජ පණ්ඩාරම් කුමරු රජකමට පත් කළෝ ය. ඔහු පෘතුගීසි විරෝධී අයෙකු ලෙස ක්‍රියා කළ අතර කැලිකට්හි සැමොරින් නම් පාලකයාගෙන් ඒ සඳහා උපකාර ද පැතී ය. මේ බැව් දැනගත් ගෝවේ පෘතුගීසි ප්‍රතිරාජයා ක්‍රි.ව. 1591 දී යාපනයට හමුදවක් එවී ය. හමුදව රජු මරාදමූ අතර නල්ලූර් නගරය ද කොල්ලකා දේවාලය ද විනාශ කර දමන ලදී.

ඉන්පසු පෘතුගීසි ගැති රජෙකු යාපනයට පත්කළ අතර ක්‍රි.ව. 1615 දී එම රජුගේ මරණින් පසු සංකිලි නමැති තවත් අයෙකු තාවකාලික ව යාපනයේ බලය අල්ලා ගෙන සිටිය ද ක්‍රි.ව. 1621 දී යාපනයේ පෘතුගීසි බලය තහවුරු විය.




**සිතියම 9.3 පෘතුගීසීන් හා ලංකාව**

පෘතුගීසීන්ට කෝට්ටේ හා යාපනය රාජ්‍යවල අභ්‍යන්තර ආරවුල් මත තම බලය පිහිටුවා ගැනීමට පහසු වුවා මෙන් ම සීතාවක රාජ්‍යයට අයත් ඇතැම් ප්‍රදේශ ඈඳා ගැනීමට ද එම රාජ්‍යයේ වූ අභ්‍යන්තර අර්බුද හේතු විය.

සීතාවක රාජ්‍යයේ පරිහානියට හේතු වූයේ ද පළමුවැනි රාජසිංහ රජුගේ අදූරදර්ශී ක්‍රියා පිළිවෙළයි. රාජසිංහ රජුට උඩරට, ප්‍රදේශය ඈඳ ගැනීමට උපකාර කළ වීරසුන්දර බණ්ඩාර නම් උඩරට ප්‍රධානියාව සැකයක් නිසා බොරු වළක දමා මැරවීම නිසා උඩරට වැසියා රජුට විරුද්ධ වූ අතර වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර පෘතුගීසි රැකවරණය පැතී ය. ඔහු 1592 දී පළමුවැනි විමලධර්මසූරිය නමින් උඩරට රජකමට පත් විය. විමලධර්මසූරියගේ දක්ෂ නායකත්වය යටතේ උඩරට රාජධානිය ප්‍රබල නිදහස් රාජධානියක් ලෙස නැගී ආවේ ය.

පළමු වෙනි රාජසිංහ රජුගේ ඇවෑමෙන් රජකමට සුදුස්සෙකු නොසිටි බැවින් මේ රාජ්‍යයට අයත් බොහෝ ප්‍රදේශ උඩරට ද තව කොටසක් පෘතුගීසීන් ද සතු කරගන්නා ලදී.

පළමුවැනි රාජසිංහ රජු උඩරට රාජ්‍ය ආක්‍රමණය කළ අවධියේ එහි පාලකයා වූයේ කරල්ලියැද්දේ බණ්ඩාර ය.රාජසිංහ රජු විසින් පරාජය කිරීම නිසා කරල්ලියද්දේ බණ්ඩාර රජු තම දියණිය වූ කුසුමාසන දේවිය ද බෑණා වූ යමසිංහ බණ්ඩාර ද රැගෙන පෘතුගීසීන් වෙත ගියේ ය. ටික දිනකින් කරල්ලියද්දේ බණ්ඩාර රජු මිය ගිය පසු පෘතුගීසීන් යටතේ හැදී වැඩුණ කුසුමාසන දේවිය " දෝන කතිරිනා" නමින් ද යමසිංහ බණ්ඩාර " දොන් පිලිප් " නමින් ද බෞතිස්ම ලැබී ය. මෙය උඩරට රාජ්‍යයට ඇස ගසා සිටි පෘතුගීසීන් ලද කදිම අවස්ථාවක් විය.

පෘතුගීසීන් දෙන් පිලිප් ව උඩරට රජු බවට පත් කිරීම සඳහා කොනප්පු බණ්ඩාර යටතේ උඩරටට හමුදවක් යැවී ය. පළමුවන රාජසිංහ රජු මේ සටනින් පරාජය වීම නිසා උඩරට රජු ලෙස දෙන් පිලිප් පත් විය. එහෙත් දක්ෂ රණ ශූරයෙකු වූ කොනප්පු බණ්ඩාර උපක්‍රමශීලි ව පළමුවන විමලධර්මසූරිය නමින් රජ වී කුසුමාසන දේවිය විවාහ කරගනු ලැබී ය. මෙය පෘතුගීසීන් හා උරණ වීමට හේතු විය. ඒ නිසා රජු පරාජය කිරීමට වරින් වර හමුද උඩරටට එවනු ලැබුව ද සියල්ල ව්‍යවර්ථ විය. පෘතුගීසීන්ට අන්ත පරාජයක් ලැබීමට පවා සිදු විය.

1 විමලධර්මසූරිය රජු ඉතා ම දක්ෂ පාලකයෙක් වූ අතර ඔහුට එක ම බාධාව වූයේ පෘතුගීසීන් උඩරට දේශසීමා ප්‍රදේශවලට පුරුද්දක් වශයෙන් වර්ෂයකට කිහිප වතාවක් කඩා වැදී ගම් බිම් විනාශ කර කොල්ලකෑම ය.

පෘතුගීසි සම්බන්ධ ව වැදගත් වන අනෙක් උඩරට රජෙකු වූයේ දෙවැනි රාජසිංහ රජු ය. එතුමා පෘතුගීසීන් සහමුලින් ම මෙරටින් පන්නා දැමීමට අධිෂ්ඨාන කළ අයෙකි. ඔහුට ලන්දේසින්ගේ ආධාරයෙන් පෘතුගීසින් පන්නා දැමීමට ද හැකිවිය. උඩරට සමග පෘතුගීසි සබඳතාව ආක්‍රමණශීලි එකක් විය.

**ක්‍රියාකාරකම**

**කෝට්ටේ සහ යාපනය රාජ්‍ය පෘතුගීසීන් සතු වීමට හේතුව වූයේ රාජ්‍යවල වූ අභ්‍යන්තර ගැටුම් ය. රටක අසමගිය එම රටේ විනාශයට හේතු වන බව මේ ඇසුරින් පැහැදිලි කරන්න.**

## ලන්දේසීන් හා උඩරට අතර සම්බන්ධතා

ක්‍රි.ව. 1602 දී ජොරිස් ෆන් ස්පිල්බර්ජන් නමැති ලන්දේසි ජාතිකයා කන්ද උඩරට පළමු වන විමලධර්මසූරිය රජ දවස මුලින් ම ලංකාවට පැමිණියේ ය. ඉන් අනතුරු ව සී. බොල්ට් ද වාර්ට් ඇතුළු පිරිසක් මඩකලපුවේ සිට පෘතුගීසි නැව්වලට රජුගේ අවසරයක් නැති ව පහරදීම නිසා රජුගේ උදහසට ඔවුන් ලක් විය.

දෙවන රාජසිංහ රජතුමා පෘතුගීසීන් පලවා හැරීමට නාවුක බලය සහිත ජාතියකගේ ආධාර බලාපොරොත්තුවෙන් සිටි අතර ක්‍රි.ව. 1638 දී ලන්දේසීන් සමග ගිවිසුමකට එළඹීමට එතුමා සමත් විය.

**1638 ගිවිසුමේ කොන්දේසි කිහිපයක් මෙසේය**

- පෘතුගීසින් පළවා හැරීමට ලන්දේසීන් රජුට උදව් විය යුතු ය
- යුද්ධය සඳහා යන සියලු වියදම් උඩරට රජු විසින් දැරිය යුතු ය
- ලන්දේසීන්ට වෙළෙඳාමේ තනි අයිතිය හා වරායන් ලබාදිය යුතු ය

එම ගිවිසුම අනුව ලන්දේසීන් විසින් පෘතුගීසීන් සතු ව පැවැති ත්‍රිකුණාමලය මීගමුව, ගාල්ල, මඩකලපුව ආදී බලකොටු අල්ලා ගන්නා ලද නමුත් ඒවායින් ගාල්ල, මීගමුව බලකොටු නැවත රජුට බාර නොදී තමන් යටතේ තබා ගන්නා ලදී. මේ නිසා රජු හා ලන්දේසීන් අතර මතභේද ඇති විය.

ක්‍රි.ව. 1640 සිට යුරෝපයේ ලන්දේසි - පෘතුගීසි මිත්‍රත්වයක් පැවති නිසා ලංකාවේ ද දෙපිරිස අතර සාමය පැවතුනි. නැවත ක්‍රි.ව. 1652 සිට සටන් ඇති විය. අඟුරුවාතොට හා කළුතර බලකොටු අල්ලා ගන්නා ලද අතර ක්‍රි.ව. 1656 දී කොළඹ ද ක්‍රි.ව. 1658 දී මන්නාරම හා යාපනය ද අල්ලාගෙන ක්‍රි.ව. 1658 වන විට පෘතුගීසි බලය මුහුදු බඩ ප්‍රදේශවලින් සියතට ගැනීමට ලන්දේසීන්ට හැකි විය.

එම බලකොටු නැවත රජුට ලබා නොදුන් අතර රජු වරෙක දැඩි ප්‍රහාර ලන්දේසීන්ට එල්ල කළේ ය. පෘතුගීසීන් වෙනුවට තවත් ප්‍රබල විදේශීය ජාතියක් මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගත් නිසා "ඉඟුරු දී මිරිස් ගත්තා ය" යන කියමන භාවිත විය. රජු ලන්දේසීන්ට යැවූ ලිපිවල "ත්‍රිසිංහලාධිශ්වර" යනුවෙන් ප්‍රකාශ වීමෙන් පැහැදිලි වන්නේ රජු ලන්දේසීන් නොතැකූ බවයි. ලන්දේසීන් ද රජුට පක්ෂපාතී බව දක්වමින් "ඔබතුමාගේ කොළඹ කොටුවේ කපිතාන්" ආදී වශයෙන් තමන් හඳුන්වා රජු අමතා ඇත.

ලන්දේසි ආණ්ඩුකාර රයික්ලොෆ් වන්හුන්ස් දෙවන රාජසිංහ රජු සමග ගැටෙමින් කටයුතු කළ නමුත් ලෝරන්ස් පිල් වැනි ආණ්ඩුකාරවරුන් රජතුමා සතුටු කරවීමට තෑගි බෝග ආදිය යවා එතුමා සමග සාමාකාමී ව කටයුතු කර ඇත. දෙවන රාජසිංහ රජතුමා පෘතුගීසි ලන්දේසි යන විදේශීය සතුරන් ඉදිරියේ අභීතව සටන් කළ නායකයකු බව පැහැදිලි වේ.



9.1 රූපය දෙවන රාජසිංහ රජු

දෙවන විමලධර්මසූරිය රජතුමා දෙවන රාජසිංහ රජුගේ පුත් කුමාරයා ය. මෙතුමා සාමාකාමී පාලකයෙකි. ලන්දේසීන් උඩරටට අයත් වරායන් ආපසු බාර නොදීම නිසා ගැටුම් ඇති විය.

### දෙවන විමලධර්මසූරිය රජතුමා

- සාමකාමී පාලකයෙකු
- ලන්දේසීන් සමග මිත්‍රත්වයෙන් කටයුතු කළ පාලකයෙකු
- ලන්දේසි ආධාර ඇති ව සියම් දේශයෙන් උපසම්පදව ගෙන්වා ගත් පාලකයකු
- දළදා මන්දිරය තෙමහල් මන්දිරයක් බවට පත් කළ පාලකයකු වශයෙන් හැඳින්විය හැකි ය.

අනතුරු ව ඔහුගේ පුත් ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ ක්‍රි.ව. 1707 දී උඩරට රජ විය. මේ රජතුමා දක්ෂ පාලකයෙකු නොවූ අතර අභ්‍යන්තර කුමන්ත්‍රණ ද මේ රජ දවස පැවතුනි. උඩරට වෙළෙඳාම සඳහා මෙකල ලන්දේසීන්ගෙන් කල්පිටිය හා පුත්තලම වරායන් විවෘත කරන ලෙස ඉල්ලා සිටියත් එය ඉටු නොවූ නිසා රජතුමා උඩරටියන්ට ලන්දේසීන් සමග වෙළෙඳාම් තහනම් කර කඩවත් ද වසා දමන ලදී. මේ නිසා ලන්දේසීන්ට අවශ්‍ය, පුවක්, ගම්මිරිස්, එනසාල් සහ අලි ඇතුන් ලබාගැනීම අපහසු විය. තව ද මෙකල පහතරට වැසියන් ලන්දේසීන්ට එරෙහි ව කැරලි ගසන විට රජු අනුබල දෙන බවට චෝදනාවක් ද එල්ල විය. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ මව සහ බිසව ද දකුණු ඉන්දියාවේ නායක්කාර් වංසයට අයත් විය. මේ රජුට දරුවන් නොසිටි නිසා ක්‍රි.ව. 1739 දී රජුගේ අභාවයෙන් පසු උඩරට සිහසුන නරේන්ද්‍රසිංහ රජුගේ බිසවගේ සොහොයුරා වන ශ්‍රී විජය රාජසිංහට හිමි විය.

නායක්කාර් වංශික රජවරුන් බුදු දහම වැළඳගෙන පාලනය මෙහෙයවීමට උත්සාහ ගත්ත ද රදලයින්ගේ හා රටවැසියාගේ එතරම් පක්ෂපාතීබවක් නොලැබුණි.

ක්‍රි.ව. 1739 සිට 1747 දක්වා රජකළ ශ්‍රී විජය රාජසිංහ රජු ලන්දේසීන් කෙරෙහි දැඩි විරුද්ධවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. මේ වන විට උඩරට හා දකුණු ඉන්දියාව අතර වෙළෙඳාමට නායක්කාර් වංශිකයන් ද පැමිණ සිටි නිසා ලන්දේසීන් වරායන් ලබා නොදීම ගැටුම්වලට හේතු විය.

ශ්‍රී විජය රාජසිංහ රජුට පසු උඩරට රජු වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය. (ක්‍රි.ව. 1747 - 1782) මෙතුමා නායක්කාර් වංශිකයන්ගේ උපදෙස්වලට නැඹුරුවීම නිසා උඩරට රදලයන් සමග ගැටුම් ඇති විය. මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ලන්දේසි ආණ්ඩුකාර වන් එක්. ක්‍රි.ව. 1765 දී උඩරට ආක්‍රමණය කළේ ය. ලන්දේසීන් කියා සිටියේ උඩරට රජු වාර්ෂික ව කප්පම් ගෙවිය යුතු බවයි. රජු මෙයට අකැමැති වී අගනුවර අතහැර පසු බැස්සේ ය. රදල සහාය නොලද නිසා ලන්දේසීන් සමග සාම ගිවිසුමකට එළඹීමට රජුට සිදු විය. විලෙම් ෆැල්ක් ආණ්ඩුකාරය සකස් කළ 1766 ගිවිසුම ලන්දේසීන්ට වාසි සහගත විය.

### 1766 ගිවිසුමේ කොන්දේසි කිහිපයක් මෙසේය

- කොළඹ, ගාල්ල, මාතර, යාපනය දිසාවන් සහ ත්‍රිකුණාමලය, මන්නාරම, කල්පිටිය වරායන්ද ලන්දේසීන්ට පවරා දිය යුතු ය
- මුහුදුබඩ ගව්වක් පළල බිම් තීරුව ලන්දේසීන්ට පැවරීම
- කන්ද උඩරටට වෙළඳාම, කුරුඳු තැළීම, දුවඳඩු කපා ගැනීමට රජු අවසර දිය යුතු ය

☞ ලුණු ලේවායන්ගේ අයිතිය උඩරටට ඇති අතර ලන්දේසීන්ට මුහුදුබඩ ප්‍රදේශ පවරාදීමෙන් යම් පාඩුවක් වේ නම් වාර්ෂික ව යම් මුදලක් ලන්දේසීන් විසින් රජුට ගෙවිය යුතු ය

☞ උඩරටින් පහත රටට ගිය සිංහලයන් ද පහතරටින් උඩරට ගිය සිංහලයන් ද ආපසු යැවිය යුතු ය

මේ ගිවිසුම නිසා උඩරට රාජ්‍යයට වරායන් අහිමි වී ආර්ථිකය අඩාල විය. මෙය උඩරට රාජ්‍යයට අවාසිදයක වූ ගිවිසුමක් ලෙස පිළිගැනේ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසීන්ගේ සහාය ඇති ව බුදු සසුනේ දියුණුව සඳහා සියම් දේශයෙන් උපසම්පද භික්ෂූන් වහන්සේලා ද ගෙන්වා ගෙන ඇත.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුට පසු ව බලයට පත් වූ රාජාධිරාජසිංහ රජු ද ලන්දේසීන් සමග වරෙක සාමකාමීව සාකච්ඡා පැවැත්වූ අතර තවත් වරෙක කඩවත් වසා දමා විරෝධතා දක්වමින් කටයුතු කළ පාලකයෙකි. රජු කඩවත් වසා දමා ලන්දේසීන්ට උඩරට වෙළෙඳාමට බාධා පමුණුවන විට දී ලන්දේසීන් විසින් ලුණු ලේවායන් හා උඩරට සම්බන්ධ මාර්ග වසා දමන ලදී.

කෙසේ වුවත් ක්‍රි.ව. 1796 වන විට දී ඉංග්‍රීසින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගැනීම නිසා ලන්දේසි - උඩරට සබඳතා ඉන් අවසන් වේ. මෙයින් පසු ඉංග්‍රීසීන් හා උඩරට රාජ්‍ය අතර සබඳතා ඇති විය.

## උඩරට රජවරුන් හා ලන්දේසීන් අතර ඇති වූ ගිවිසුම්

* ක්‍රි.ව. 1638 දෙවන රාජසිංහ රජතුමා හා ලන්දේසීන් අතර ඇති වූ ගිවිසුම
* ක්‍රි.ව. 1766 කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා හා ලන්දේසීන් අතර ඇති වූ ගිවිසුම

### ක්‍රියාකාරකම

1. **උඩරට රජවරුන්ගේ නාම ලේඛනයක් පිළියෙළ කරන්න.**
2. **කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් සිදු වූ ආගමික සේවාව ගැන රචනාවක් ලියන්න.**

## උඩරට රාජ්‍ය සමග ඉංග්‍රීසි සබඳතා

බ්‍රිතාන්‍ය අවධානය ශ්‍රී ලංකාවට යොමුවීමට හේතු කිහිපයකි.

✦ පෙර අපර දෙදිග නැව් මාර්ගයේ සංධිස්ථානයක ලංකාව පිහිටා තිබීම.

✦ ඊසාන දිග මෝසම් කාලවල දී ආරක්ෂිත ව නැව් නවතා තැබිය හැකි ස්වභාවික වරායක් වූ ත්‍රිකුණාමලය පිහිටා තිබීම.

✦ ඉන්දියාවේ නැගෙනහිර හා බටහිර වෙරළේ නාවික බලය ලංකාවේ සිට පාලනය කළ හැකි වීම.

ලංකාවේ මුහුදුබඩ පළාත් පාලනය කළ ලන්දේසීන් පලවා හැරීම සඳහා එවකට උඩරට පාලකයා ලෙස සිටි කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ඉංග්‍රීසි සහාය පැතී ය. පසු ව ත්‍රිකුණාමලය, යාපනය, මන්නාරම, හා කල්පිටිය, අල්ලාගත් ඉංග්‍රීසින් ක්‍රි.ව. 1796 දී කොළඹ ද අල්ලා ගත්හ. මෙම මුහුදු බඩ ප්‍රදේශ පවරා ගැනීම බ්‍රිතාන්‍ය රජතුමා නමින් සිදුවුව ද ඒවායේ පාලන කටයුතු පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම මගින් සිදු විය. ඔවුන් ඇති කරන ලද බදු ප්‍රතිපත්තියට (පොල් බද්ද, රා බද්ද, මාළු බද්ද, ලුණු බද්ද ආදී) විරුද්ධ වූ ලාංකික ජනතාව ඉංග්‍රීසි පෙරදිග වෙළඳ සමාගමේ පාලනයට විරුද්ධ ව ක්‍රි.ව. 1797 දී කැරලි ඇති කළහ. මෙම අරගල මර්දනය කිරීමෙන් පසු ඒ පිළිබඳ ව සොයා බැලීම සඳහා ද "මියුරන්කොමිස" පත්කර එවන ලදී.

මින් පසු ලංකාවේ බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ප්‍රදේශ ක්‍රි.ව. 1802 දී බ්‍රිතාන්‍යය යටත් විජිත තත්ත්වයට පත් කෙරිණ. මෙකල ආණ්ඩුකාරයා ලෙස පත් වූ සර් පෙඩ්රික් නෝර්ත් ක්‍රි.ව. 1803 දී උඩරට රාජ්‍ය යටත් කරගැනීමට හමුද මෙහෙයුමක් දියත් කළේ ය.

**ඉංග්‍රීසින් උඩරට කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු**

- වෙළෙඳ කටයුතු කරගෙන යාමේ දී උඩරට හා මුහුදුබඩ ප්‍රදේශ අතර දේශ සීමාවේ පිහිටි කඩවත්වල දී උඩරට රාජ්‍යයට බදු ගෙවීමට සිදු වීම
- කොළඹ හා ත්‍රිකුණාමලය අතර සබඳතා පැවැත්වීමේ දී උඩරට රාජ්‍ය බාධාවක් වීම
- රට මැද ස්වාධීන රාජ්‍යයක් ලෙස උඩරට පැවැතීම බ්‍රිතාන්‍ය පාලනයට බාධාවක් වීම
- වෙරළ තීරයේත්, උඩරට දේශසීමාවලත් මුරපොළවල් පැවැත්වීම නිසා යුද වියදම් අධික වීම

මෙම හමුදාවට මුහුණ දීමට අපොහොසත් වූ රජතුමා සිය හමුදාව සමග හඟුරන්කෙත ප්‍රදේශයට පසුබැස්සේ ය.

මේ අවස්ථාවේ දී ඉංග්‍රීසි හමුදාව දුෂ්කරතා රැසකට මුහුණ දුන්නේය.

**දුෂ්කරතා**

- ලෙඩ රෝග වැළඳීම
- වර්ෂා කාලය එළඹීම
- ආහාරපාන ලබාගැනීමට අපහසු වීම
- බෙහෙත් ලබා ගැනීමට අපහසු වීම
- කොළඹ සමග සම්බන්ධතා පවත්වා ගැනීමට නොහැකි වීම

දුෂ්කරතාවලට පත් වූ ඉංග්‍රීසි හමුදාවට ප්‍රහාර එල්ල කර මෙම සටන මැඩ පැවැත්වීම නිසා පළමුවෙනි උඩරට ආක්‍රමණය අසාර්ථක විය.

සර් තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා උඩරට සමග සාමකාමී ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය.

**සර් තෝමස් මේට්ලන්ඩ්**

- රාජකාරි ක්‍රමය නැවත ඇති කිරීම
- සිවිල් නිලධාරීන්ට සිංහල හා දෙමළ භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට දිරි ගැන්වීම
- ක්‍රි.ව. 1810 දී අපරාධ නඩු විසඳීම සඳහා ජූරිසභා ක්‍රමය හඳුන්වා දීම

යුද්ධ කිරීමෙන් හෝ උඩරට අල්ලා ගත යුතු බව කල්පනා කළ බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා උඩරටට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කළේ ය. මේ අවස්ථාව වන විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට විරුද්ධ ව ඇහැලේපොළ මහාදිකාරම් යටතේ පැවති සබරගමු ප්‍රදේශයේත් විරෝධතා ව්‍යාපාර පැනනැගුණි. කැරලි ඇති කිරීම ඇහැලේපොළගේ ක්‍රියාවක් ලෙස සිතූ රජතුමා ඔහුගේ බිරිඳ හා දරුවන් කෲර ලෙස මැරවී ය. මෙම සිද්ධියෙන් ද පසු රජුට තිබූ ජනතා පක්ෂපාතීත්වයත් රදලවරුන්ගේ සහායත් ඉංග්‍රීසින්ට හිමි විය.

මෙය අවස්ථාවක් කරගත් ඉංග්‍රීසීහු හමුද දියත් කර උඩරට පාලකයා වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිරභාරයට ගෙන ක්‍රි.ව. 1815 දී උඩරට යටත් කර ගත්හ. ක්‍රි.ව. 1815 මාර්තු දෙවැනි දින මහනුවර මගුල් මඩුවේ දී රොබට් බ්‍රවුන්රිග් හා රදල ප්‍රධානීන් අත්සන කළ ගිවිසුමෙන් පසු උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට පැවරුණි.

ඉංග්‍රීසි පාලනය කෙරෙහි උඩරට ජනතාව තුළ ඇති වූ විරෝධතාව නිසා ක්‍රි.ව. 1818 දී නිදහස් අරගලයක් ඇති විය. වෙල්ලස්ස ප්‍රදේශයෙන් ඇරඹුන මෙම අරගලයට බල පෑ හේතු කිහිපයකි.

1. පැරණි නීතිරීති අනුව පාලනය ගෙනයාමට පොරොන්දු වුවත් එය ක්‍රියාත්මක නොවීම
2. උඩරට සිරිත් විරිත් අනුගමනය නොකිරීම හා ඒවා බිඳ දැමීම
3. ආගමික ස්ථාන හා සංඝයා වහන්සේලා වෙනුවෙන් යුතුකම් ඉටු නොවීම
4. උඩරට ප්‍රභූවරුන්ට හිමි ව තිබූ ආදායම් මාර්ග හා වරප්‍රසාද අහිමි වීම
5. සිංහලයන් වැඩි වශයෙන් ජීවත් වූ වෙල්ලස්ස ප්‍රදේශයට හජ්ජි මරික්කාර් නමැති මුස්ලිම් මුහන්දිරම් කෙනෙකු පත් කිරීම

වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භ වූ සටන උඩරට පුරා පැතිර ගියේ ය. අරගලය මැඩලීම සඳහා ඉංග්‍රීසින් යැවූ කැප්පෙටිපොළ කැරලිකරුවන්ට එකතු විය. පිළිමතලාවේ හා මඩුගල්ලේ ද එකතු විය. රාජ්‍ය උරුමයේ සංකේතය වූ දන්ත ධාතූන් වහන්සේ ඉංග්‍රීසීන් අතට පත් විය.

ඉංග්‍රීසින්ගේ පාලනයට විරුද්ධ ව ඇති වූ දෙවන නිදහස් අරගලය ක්‍රි.ව. 1848 දී ඇති විය.

## 1848 නිදහස් අරගලයට හේතු

- ගම්සභා සතු බලතල උසාවිවලට පැවරීම නිසා සුළු ආරවුලක් විසඳා ගැනීම සඳහා ද උසාවිවලට යාමට සිදු වීම
- ක්‍රි.ව. 1840 දී වගා නොකළ සියලු ඉඩම් රජයට පවරා ගැනීම
- පාරම්පරික ඉඩම් අහිමිවීම නිසා සතුන් ඇති කිරීමට නිදහස් ඉඩම් නොමැති වීම
- වතුවගාව නිසා ගැමි ජීවන රටාව අවුල් වීම
- සුරාසල් පැතිරීම නිසා සමාජය පිරිහීම
- ඉංග්‍රීසි පාලනය පිළිගැනීමට ජනතා අකැමැත්ත
- අලුත් බදු පැනවීම ටොරින්ටන් ආණ්ඩුකාරයා පියවර ගැනීම

ජනතාව කුපිත කළ අසාධාරණ බදුවලට ඇති වූ විරෝධය නිසා අරගලය ආරම්භ විය. විරෝධතා ව්‍යාපාරයේ මුල්තැන ගත්තේ කඩහපොළ හිමි, ගොන්ගාලේගොඩ බණ්ඩා, වීර පුරන් අප්පු යන අයයි. උඩරට සීමිත ප්‍රදේශයක පැතිරීගිය මෙම අරගලය මැඩ පවත්වා එහි නායකයන් මරා දැමීමට ඉංග්‍රීසින්ට හැකි විය.

## ක්‍රියාකාරකම

**ක්‍රි.ව. 1815 මගුල් මඩුවේ දී අත්සන කළ උඩරට ගිවිසුමේ තොරතුරු සොයා බලා වාර්තා කරන්න.**

## අභ්‍යාස

1. ප්‍රථමයෙන් ලංකාවට පැමිණි යුරෝපා ජාතිය නම් කරන්න.
2. මල්වානේ ගිවිසුම යනු කුමක් ද?
3. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය කළ කාලය කොපමණ ද?
4. මෙරට අවසන් සිංහල රජු කවුද?

## සාරාංශය

- යුරෝපීයයන් පෙරදිගට පැමිණියේ වෙළෙඳාම හා ධර්මප්‍රචාරය සඳහා ය.
- බටහිර ජාතීහු ලංකාවේ රාජ්‍ය තුළ තිබූ අර්බුද ආශිර්වාදයක් කර ගනිමින් තමන්ගේ අරමුණු කරා පා නැගූහ.

## වැඩිදුර කියවීමට පොත්

- මහවැලිවංසය
- ශ්‍රී ලංකාවේ ඉතිහාසය 3 සහ 4 කාණ්ඩ - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව